සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## පුරවැසි අධ්‍යාපනය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 1 | (11) | 2 | (21) | 4 | (31) | 3 |
| (2) | 3 | (12) | 2 | (22) | 2 | (32) | 3 |
| (3) | 4 | (13) | 1 | (23) | 4 | (33) | 4 |
| (4) | 3 | (14) | 3 | (24) | 2 | (34) | 2 |
| (5) | 2 | (15) | 2 | (25) | 3 | (35) | 2 |
| (6) | 1 | (16) | 1 | (26) | 1 | (36) | 1 |
| (7) | 3 | (17) | 3 | (27) | 2 | (37) | 2 |
| (8) | 3 | (18) | 2 | (28) | 1 | (38) | 4 |
| (9) | 3 | (19) | 3 | (29) | 2 | (39) | 4 |
| (10) | 4 | (20) | 1 | (30) | 1 | (40) | 1 |

(ලකුණු 1x40=40)

## පුරවැසි අධ්‍යාපනය II

(01) (i) ලංකාව, ඉන්දියාව (ලකුණු 2)

(ii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය (ලකුණු 2)

(iii) ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව (ලකුණු 2)

(iv)
- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම.
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම. (ලකුණු 2)

(v) හිරු එළිය, ජලය, වාතය (ලකුණු 2)

(vi) තරඟකාරී වෙළෙඳපොළක් පැවැතීම, ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම, ආදායම් අසමාන ලෙස බෙදීයාම. (ලකුණු 2)

(vii) පෞද්ගලික අංශය දිරි ගැන්වීම, රජය ව්‍යවසාය කටයුතු වලින් ඈත් වීම, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම (ලකුණු 2)

(viii) - මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම, ජනතා සහභාගීත්වය ඇති කර ගැනීම, ස්වභාවික සම්පත් සංරක්ෂණය (ලකුණු 2)

(ix) - විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම, ජාත්‍යන්තර වෙළෙඳපොළ පදනම් කර ගත් දේශීය නිෂ්පාදන බිහිවීම, ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන බිහිවීම (ලකුණු 2)

(x) ආගමික වතාවත් කෙරෙහි යොමු වීම, මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්, උපදේශනය මගින්, ස්වාභාවික පරිසරය නිරීක්ෂණය මගින් (ලකුණු 2)

(ලකුණු 2x10=20)

(02) (i) ඒබ්‍රහම් ලින්කන්, සීලර් (ලකුණු 2)

(ii) ◆ මහජනතාවගේ බහුතර කැමැත්ත මත පාලනය සඳහා නියෝජිතයින් තෝරා ගැනීම.

◆ ආණ්ඩු බලය හිමි වන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත් වූ පක්ෂයට හෝ කණ්ඩායමටය.

◆ නීති සම්පාදනය කරනු ලබන්නේ ද මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත අනුවය. (කරුණු තුනක් දැක්වීමට ලකුණු 3)

(iii) (a) ජනතාවට පාලනයට සහභාගි වීමේ අවස්ථාව ලැබීම, සුදුසු දේශපාලන පක්ෂයක් සහ සුදුසු නියෝජිතයන් තෝරා ගැනීමට සාමාන්‍ය ජනතාවට අයිතිය ලැබීම, නියම කරන ලද වයස් සීමාවක් ඉක්ම වූ පුරවැසියන්ට කිසිදු භේදයකින් තොරව ඡන්ද බලය හිමි වීම. (ලකුණු 3)

(b) මින් එක් කරුණක් විස්තර කිරීමට (ලකුණු 2)

(03) (i) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය (මින් දෙකක් නම් කිරීමට ලකුණු 2)

(ii) ◆ පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම

◆ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක හා පාලිත දෙපක්ෂයම දැනුවත් වීම

◆ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වීම

◆ නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම (ප්‍රයෝජන තුනක් සඳහන් කිරීමට ලකුණු 3)

(iii) (a) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත සැපයීම, අපක්ෂපාතීව සහ සමාජයේ යහපැවැත්මට හිතකර අන්දමින් තොරතුරු සැපයීම, ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම, ජනතාවගේ දැනුම වර්ධනය කිරීම (ලකුණු 3)

(b) මින් එක් කරුණක් විස්තර කිරීමට (ලකුණු 2)

(04) (i) දේශපාලන බලය, පරිපාලන බලය, ආර්ථික බලය (දෙකක් නම් කිරීමට ලකුණු 2)

(ii) පරිපාලන රටාව විමධ්‍යගත කිරීම, මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශිය පාලන ඒකක වෙත පවරා දීම, රාජ්‍ය ව්‍යවසායකත්වයට හෝ අධිකාරියට අයත් බලතල ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම (ස්වරූප තුනක් දැක්වීමට ලකුණු 3)

(iii) (a) ◆ ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාත්මක කිරීම.

◆ මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණු සහිතව එකී පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.

◆ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මඟින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම. (ලකුණු 3)

(b) මින් එක් කරුණක් විස්තර කිරීමට (ලකුණු 2)

(05) (i) ටී.බී. ටයිලර්, චාර්ල්ස්. ඒ. එල්වුඩ්, ඊ.ටී. හීලර් (ලකුණු 2)

(ii) ◆ විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරණ, විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.

◆ ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේනික සිරිත් විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවැතීම.

◆ එක ජන කොටසක වුවද ප්‍රාදේශීයව විවිධත්වයක් දැකිය හැකි වීම.

◆ ගෝලීයකරණය, සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හා සංචාරක ව්‍යාපාරය දියුණු වීම හේතුවෙන් ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම. (ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 2)

(iii) (a) පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ, විවිධ ජාතීන් වෙළෙඳාම සඳහා පැමිණීම (ලකුණු 3)

(b) ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වීම, ගැටුම් අවම වීම, එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වීම (ලකුණු 2)

(06) (i) වැඩ ලෝකය පුළුල් වීම, ගෝලීය වෙළෙඳපොළ පුළුල් වීම, ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකි වීම (මින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 2)

(ii) වෙළෙඳපොළ පාලනය, සම්බාධක පැනවීම, ලෝක බලවතුන් තම ආධිපත්‍ය පවත්වා ගැනීම (බලපෑම් තුනක් සඳහන් කිරීමට ලකුණු 3)

(iii) (a)
- බහු ජාතික සමාගම් බිහිවීම
- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වාදීම
- විවිධ කලාපීය සංවිධාන බිහිවීම
- තොරතුරු තාක්‍ෂණයේ විප්ලවීය වෙනසක් සිදුවීම (ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 3)

(b) ඉන් එක් ලක්‍ෂණයක් විස්තර කිරීමට (ලකුණු 2)

(07) (i) පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර, රටවල් අතර (මින් දෙකක් දැක්වීමට ලකුණු 2)

(ii) ආත්මාවබෝධය, ඉවසීම, ඵලදායි තීරණ ගැනීම, දරා ගැනීමේ ශක්තිය (ගුණාංග තුනක් දැක්වීමට ලකුණු 3)

(iii) (a) සාකච්ඡා ක්‍රමය, කේවල් කිරීම හා සහමන්ත්‍රණය, මැදිහත්කරණය, සමථකරණය (ක්‍රම තුනක් දැක්වීමට ලකුණු 3)

(b)
- ගැටුමක් උග්‍ර වීම වලක්වා ගත හැකි බවත් ඉන් මානසික සහනය හා සතුට ඇති වීම.
- සාර්ථක ලෙස ගැටුම් නිරාකරණය තුළින් චිත්තවේගය කැළඹීම් වලට සාර්ථකව මුහුණ දීම.

(ලකුණු 2)